# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2492/09 - 2026 ජූනි මස 08 වැනි සඳුදා - 2026.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 11/3/3/1/95-1.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/3/2017/FR/275.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

මෙහි මහජන කටයුත්තක් යනු නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා ඉඩම් අත් කර ගැනීම වේ.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 385 පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි ගෝනමඩවත්ත (ලග්ගල ගෘහප්) නමැති ඉඩමේ සර්වේ ජනරාල් විසින් 2026.02.17 දිනැතිව පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 310252 හි, කලාප අංක 01, පත්‍ර අංක 2, කැබලි අංක 1 හි මුළු වර්ගඵලය හෙක්ටයාර් 1.7529 වේ;

01. කැබලි අංක **1**
ඉඩමේ නම : ගෝනමඩවත්ත (ලග්ගල ගෘහප්); ඉඩම් පරිහරණය: ලඳු කැලය; හිමිකම් කියන අය : කේ. එම්. මුදියන්සේ, නාගොල්ල පාර, මාතලේ; ප්‍රමාණය: හෙක්. 1.7529.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 09.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 ජූලි මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඒ. ජී. එස්. එල්. තෙන්නකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2026 ජූනි මස 01 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0050

1A - G 046943 - 08 (2026/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*